| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/01/i/පොදු | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.01 21 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**නව ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා පසුබිම් අධ්‍යයනය**

උක්ත මැයෙන් යුතු ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලේකම් ගේ අංක NPC/15/01/2021 හා 2021.12.28 දිනැති ලිපියෙහි පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.

02 එම කොමිෂන් සභාව විසින් ජාතික වැටුප් ප්‍රතිපත්තිය සකස් කිරීමට අදාළ පසුබිම් අධ්‍යයන කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බව දන්වා ඇති අතර 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006, 2006.09.22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 30, 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016, 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016, 2016.08.18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 04/2016, 2016.04.29 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 සහ ඒවායේ සංශෝධන ක්‍රියාත්මක කිරීමේ දී ඔබ අමාත්‍යාංශය /ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යාවස්ථාපිත ආයතන විසින් මුහුණ දෙනු ලැබුවා වූ ගැටළු සහ ඒවා නිරාකරණය කිරීම සම්බන්ධයෙන් වන යෝජනා වැටුප් කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස දැනුම් දී ඇත.

04. ඒ අනුව නව ජාතික වැටුප් ප්‍රතිපත්ති සකස් කිරීමේ දී අධ්‍යයනය කිරීමට හැකිවන පරිදි එම ගැටළු සහ යෝජනා ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිතව පැහැදිලිව සඳහන් කර 2022.01.24 දිනට පෙර cadreinfo.cs@gmail.com යන ඊමේල් ලිපිනයට යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

05. මේ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතන ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

**ආර්. සී. ද සොයිසා,**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

පිටපත :- 01 ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස
02 සහකාර ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු ) - කරු. අ.ක.ස

ජාතික වැටුප් කොමිෂන් සභාව
தேசிய சம்பள ஆணைக்குழு
NATIONAL PAY COMMISSION
කාමර අංක 2-116, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
அறை இல. 2-116,பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபம், பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07
Room No.2-116, B.M.I.C.H, BauddhalokaMawatha, Colombo 07

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 2669134 | ෆැක්ස්<br>பக்ச்<br>Fax | 2669134 | විද්‍යුත් තැපැල<br>மின்னஞ்சல்<br>E-mail | nsccc16@gmail.com |
| මගේ අංකය<br>எனது இல.<br>My No. | NPC/15/01/2021 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021.12. 28 |


10 JAN 2022

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්

**නව ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා පසුබිම් අධ්‍යයනය**

අංක 2162/64 හා 2020.02.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් හා වේතනවල තිරසාරභාවය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා එම අංශවල වැටුප්, වේතන ඇතුළු සියලුම පාරිශ්‍රමික ව්‍යුහයන් සමාලෝචනය කරමින් සමස්ත රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද ශ්‍රමබල අවශ්‍යතාවයන් යෝග්‍ය පරිදි සපුරාලීම පහසුකරලීම සඳහා වූ ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා රජයට උපදෙස් ලබා දීම සහ සහාය වීම පිණිස අතිගරු ජනාධිපතිතුමා විසින් ජාතික වැටුප් කොමිෂන් සභාව පත් කර ඇත.

02. ගරු මුදල් අමාත්‍යතුමා විසින් 2021.11.12 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී සිදු කරන ලද 2022 වර්ෂයට අදාළ අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේ දී රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප්වලට අදාළ සංශෝධන, වැටුප් ව්‍යුහයන් සැකසීම සහ විෂමතා ඉවත් කිරීම, ජාතික වැටුප් කොමිෂන් සභාව සතු වගකීම බවත්, එම ආයතන ව්‍යුහයෙන් බැහැරව කටයුතු කිරීමේ දී අනවශ්‍ය වැටුප් පරිමාණ සහ ව්‍යුහයන්හි නොගැළපීම් අලුතින් නිර්මාණය වන බවත්, එම නිසා එළඹෙන මුදල් වර්ෂයේ සිට රාජ්‍ය සේවයේ වැටුප් විෂමතාවයන් ඉවත් කර නව වැටුප් ව්‍යුහයක් ඇති කිරීම සඳහා කටයුතු ආරම්භ කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

03. ඒ අනුව මෙම කොමිෂන් සභාව විසින් ජාතික වැටුප් ප්‍රතිපත්තිය සකස් කිරීමට අදාළ පසුබිම් අධ්‍යයන කටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006, 2006.09.22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 30, 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016, 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016, 2016.08.18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 04/2016, 2016.04.29 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 සහ ඒවායේ සංශෝධන ක්‍රියාත්මක කිරීමේ දී ඔබ අමාත්‍යාංශය/ රාජ්‍ය අමාත්‍යාංශය/ පළාත් සභාව හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන විසින් මුහුණ දෙනු ලැබුවා වූ ගැටළු සහ ඒවා නිරාකරණය කිරීම සම්බන්ධයෙන් වන යෝජනා මෙම කොමිෂන් සභාව වෙත ලබා ගැනීමට තීරණය කර ඇත.

ඇමුණුම - 01

# ජාතික වැටුප් කොමිෂන් සභාව

## නව ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වෘත්තීය සමිති වෙතින් නියෝජන කැඳවීම

අංක 2162/64 හා 2020 පෙබරවාරි 14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් හා වේතනවල තිරසාරභාවය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා එම අංශවල වැටුප්, වේතන ඇතුළු සියලු පාරිශ්‍රමික ව්‍යූහයන් සමාලෝචනය කරමින් සමස්ත රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද ශ්‍රමබල අවශ්‍යතාවයන් යෝග්‍ය පරිදි සපුරාලීම පහසුකරලීම සඳහා වූ ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා රජයට උපදෙස් ලබා දීම සහ සහාය වීම පිණිස අතිගරු ජනාධිපතිතුමා විසින් ජාතික වැටුප් කොමිෂන් සභාව පත්කරනු ලැබ ඇත.

02. ඒ අනුව ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීමේදී අවධානයට යොමු කළ යුතු යැයි අදහස් කරනු ලබන යෝජනා පිළිබඳව ලිඛිත නියෝජනයන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන වෘත්තීය සමිති වෙතින් කැඳවීමට කොමිෂන් සභාව තීරණය කර ඇත. එම ලිඛිත නියෝජනයන් පහත කරුණු ආවරණය වන සේ ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- රජයේ සමාජ ආර්ථික ප්‍රතිපත්ති වඩාත් අර්ථවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වර්තමානයේ හා නුදුරු අනාගතයේ රාජ්‍ය සේවයට අවශ්‍ය කරන කළමනාකරණ, විද්‍යාත්මක සහ තාක්ෂණික ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුම සහිත ප්‍රවීණයන් රාජ්‍ය අංශයේ අදාළ ක්ෂේත්‍ර කෙරෙහි ආකර්ෂණය කර ගැනීම සඳහා සේවා නියුක්ති තත්ත්වයන් හි ඇති කළ යුතු වෙනස්කම්
- වඩාත් ඉහළ ඵලදායීතාවයක් හා කාර්යක්ෂමතාවයක් ලබා ගැනීමට රාජ්‍ය සේවය මෙහෙයවීමේ අවශ්‍යතාවය මෙන්ම පෞද්ගලික අංශයේ ශ්‍රම බල අවශ්‍යතා සපුරා ගැනීමට ඇති බාධක ඉවත් කිරීමේ යෝජනා
- රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද සේවා නියුක්තිකයන් තෘප්තිමත් වූත්, අභිප්‍රේරණය වූත්, අවශ්‍ය නිපුණතාවයන්ගෙන් සමන්විත වූත් පිරිසක් බවට පත් කිරීමේ යෝජනා
- රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන වෘත්තීය සුදුසුකම් හා කුසලතා සහිත නිලධාරීන් අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි හෝ විදේශ රැකියාවල නිරත වීමත් එමගින් රාජ්‍ය සේවය හැරයාම වළක්වනු පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා වන යෝජනා
- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයන්හි වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන පාරිතෝෂික දීමනා ඇතුළු විවිධ දිරිගැන්වීමේ ක්‍රම, ප්‍රදාන ක්‍රම හා මූල්‍ය නොවන දිරිකාරකයන් ලබාදීම පිළිබඳව යෝජනා
- සමාන වගකීම් දරන්නා වූ හෝ සමාන සුදුසුකම් සහිත වන්නා වූ හෝ වෘත්තිකයින් විසින් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයන්හි දී ලබන්නා වූ වැටුප් හා වේතනයන් සහ දීමනා අතර ඇති විෂමතාවයන් වේ නම් ඒවා අවම කිරීම පිණිස වූ යෝජනා
- මීට ඉහත පත් කළ වැටුප් කොමිෂන් සභා නිර්දේශ අනුව හෝ එක් එක් අවස්ථාවන්හි දී කරනු ලැබුවා වූ හෝ වැටුප් වැඩි කිරීමේ හේතුවෙන් උද්ගතව ඇති දැනට පවත්නා වැටුප් විෂමතාවයන් නිවැරදි කිරීමේ යෝජනා
- දැනට පවතින වැටුප් හා වේතන, සේවක සංඛ්‍යාව හා සේවා තත්ත්වයන්, බඳවා ගැනීමේ පටිපාටි, උසස්වීම් පටිපාටි හා සේවා ව්‍යවස්ථාවන් ආශ්‍රිතව පැන නැගී ඇති ගැටලු හේතුවෙන් ඇති වී තිබෙන විෂමතාවයන් අවම කිරීම සඳහා වන යෝජනා
- රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය විසින් දේශීය ශ්‍රම සම්පත ජාතික සංවර්ධනය සඳහා ප්‍රශස්ත අයුරින් උපයෝගී කර ගැනීමට අදාළ වන වෙනත් යෝජනා

03. සියලු ලිඛිත නියෝජනයන්, උපරිම පිටු 04 කට (A4 ප්‍රමාණයේ) සීමා වන පරිදි සකස් කළ යුතු අතර, එම නියෝජන තහවුරු කිරීමට දත්ත / සංඛ්‍යාලේඛන / වැඩිදුර තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ නම් පමණක් ඒවා ඇමුණුම් ලෙස ඇතුළත් කර ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා යෝජනා"** යනුවෙන් සඳහන් කොට 2021 ජුනි මස 17 දින හෝ එදිනට පෙර ලැබෙන සේ පහත් ලිපිනයට යොමු කරන්න.

**ලේකම්,**
**ජාතික වැටුප් කොමිෂන් සභාව,**
**කාමර අංක 2-116,**
**බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,**
**බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**

**චන්ද්‍රානි සේනාරත්න**
**ලේකම්,**
**ජාතික වැටුප් කොමිෂන් සභාව.**

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.